# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk

මගේ අංකය / எனது இலக்கம் / My NO — 304 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 05/02/2024 පැය 0550

# මාධ්‍ය නිවේදනය

**01.** **දියේ ගිලෙමින් සිටි පුද්ගලයින් 06 දෙනෙකු බේරාගැනීමක් - පොලිස් ජීවිතාරක්ෂක ඒකකය පානදුර.**

2024.02.04 වන දින සවස් කාලයේ පානදුර වෙරළ තීරයේ දිය නෑමට ගිය පිරිසක් අතරින් පුද්ගලයින් 06 දෙනෙකු දිය වැලකට හසුවී ගසා ගෙන යමින් සිටියදී පානදුර පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ පොලිස් කොස්තාපල් 69951 පුෂ්පකුමාර හා පොලිස් කොස්තාපල් 93731 දේශාන් යන නිලධාරීන් දෙදෙනා විසින් නිරුපද්‍රිතව බේරාගෙන වෙරළට රැගෙන විත් මූලික ප්‍රථමාධාර ලබා දීමෙන් අනතුරුව ඔවුන්ගේ ඥාතීන් වෙත භාරදී ඇත.

මෙලෙස බේරාගෙන ඇත්තේ අවුරුදු 16 ත් 21 අතර වයස් වල පසුවන රත්නපුර ප්‍රදේශයේ පදිංචි පිරිමි ළමුන් තිදෙනෙකු හා ගැහැණු ළමුන් තිදෙනෙකු වේ.

**02.** **අකුණු සැර වැදී පුද්ගලයෙකු මියයාම - අයගම පොලිස් වසම.**

2024.02.04 වන දින සවස් කාලයේ අයගම පොලිස් වසමේ ගංගොඩකන්ද ප්‍රදේශයේ නිවසක් ඉදිරිපිට සිටි පුද්ගලයෙකු අකුණු සැර වැදී අයගම රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට අයගම පොලිසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 62 ක් වන ගංගොඩකන්ද, අයගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අයගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03.** **හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොණරාගල පොලිස් ස්ථානය.**

2024.02.04 වන දින දහවල් කාලයේ මොණරාගල පොලිස් වසමේ මොණරාගල මහ රෝහල අසලදී මොණරාගල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **යතුරුපැදියකින් හෙරොයින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු හෙරොයින් ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 460 ක් සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන සියඹලාණ්ඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොණරාගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.

2024.02.04 වන දින උදෑසන කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ සෙම්බරන් කොටුවත්ත ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32ක් වූ ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - සිරිපුර පොලිස් ස්ථානය.

2024.02.04 වන දින සවස් කාලයේ සිරිපුර පොලිස් වසමේ පල්ලෙගම ප්‍රදේශයේ දී සිරිපුර පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු හා සැකකාරියක් කැණීම් කිරීම සඳහා යොදා ගත් උපකරණද සමඟ අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් හා සැකකාරිය අවුරුදු 27 ත් 39 ත් අතර වයස් වල පසුවන පොලොන්නරුව හා සිරිපුර ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සිරිපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - හොරණ පොලිස් වසම.

2024.02.04 වන දින දහවල් කාලයේ හොරණ පොලිස් වසමේ හොරණ රත්නපුර මාර්ගයේ පොකුණුවිට ප්‍රදේශයේදී හොරණ දෙස සිට පානදුර දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් රියදුරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයේ පෙරලී ඉදිරියට ඇදී ගොස් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ලංගම බස් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රිරෝද රථයේ රියදුරු, ඔහුගේ බිරිඳ හා වයස අවුරුදු 03 ක් වූ දියණිය තුවාල ලබා හොරණ රෝහලට ඇතුලත් කිරීමේදී බිරිඳ මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 40 ක් වන රයිගම, බණ්ඩාරගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය හොරණ රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. හොරණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - කල්පිටිය පොලිස් වසම.

2024.02.04 වන දින දහවල් කාලයේ කල්පිටිය පොලිස් වසමේ කල්පිටිය පාලවිය මාර්ගයේ කුරිඤ්ඤම්පිටිය ශාන්ත අන්තෝනි කතෝලික දේවස්ථානය ඉදිරිපිටදී ත්‍රීරෝද රථයක් කල්පිටිය දෙස සිට පාලවිය දෙසට ධාවනය කර අතුරු මාර්ගයකට

හැරවීමේදී එම මාර්ගයේ පැමිණි තවත් ත්‍රිරෝද රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රිරෝද රථ දෙකෙහි රියදුරන් දෙදෙනා, කාන්තාවන් තිදෙනෙකු හා පිරිමි පුද්ගලයින් තිදෙනෙකු තුවාල ලබා කල්පිටිය රෝහලට ඇතුලත් කිරීමේදී එක් පුද්ගලයෙකු මියගොස් ඇත. අනෙක් තුවාලකරුවන් වැඩිදුර ප්‍රතිකාර සඳහා පුත්තලම රෝහල වෙත මාරුකර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 65 ක් වන මණ්ඩලකුඩාව, කල්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කල්පිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත. කල්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**